20 178749

21/699

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව
காணி உரித்து நிர்ணயத் திணைக்களம்
LAND TITLE SETTLEMENT DEPARTMENT

1200/6, මිහිකතමැදුර, රජමල්වත්තපාර, බත්තරමුල්ල
1200/6, மிஹிகத மெதுர, இராஜமல்வத்த வீதி, பத்தரமுல்லை
1200/6, MihikathaMedura, Rajamalwatta Road, Battaramulla

බිම් සවිය
BIM SAVIYA

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: | 04/06/16-1 | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2021.04.01 |

16 APR 2021

19 APR 2021

ප්‍රධාන විධායක නිලධාරී/ විධායක අධ්‍යක්ෂ

ලංකා බැංකුව,මහජන බැංකුව,ජාතික ඉතිරි කිරීමේ බැංකුව, සම්පත් බැංකුව,කොමර්ෂල් බැංකුව,හැටන් නැෂනල් බැංකුව,සෙලාන් බැංකුව,ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,සණස සංවර්ධන බැංකුව,නේෂන් ට්‍රස්ට් බැංකුව,පැන් ඒෂියා බැංකුව, ඩී.එෆ්.සී.සී.බැංකුව,ජාතික සංවර්ධන බැංකුව,අමානා බැංකුව, කාගිල්ස් බැංකුව, ස්ටැන්ඩඩ් චාටඩ් බැංකුව, ඒච්.එස්.බී.සී.බැංකුව

**1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත ක්‍රියාත්මක කිරීම - හිමිකම් සහතිකය සම්බන්ධව**

උක්ත පනත යටතේ හිමිකම් ලියාපදිංචි කිරීමේ කටයුතු මේ වන විට ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 18 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 59 ක් තුළ ක්‍රියාත්මක වෙමින් පවතින අතර 2021 වසරේදී නව කොට්ඨාස 06 ක් වෙත වැඩසටහන ව්‍යාප්ත කිරීමට කටයුතු කරමින් පවතී.( අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ඇමුණුමක් වශයෙන් එවමි)

02. මෙහි දී යම් ඉඩම් කොටසක් සඳහා හිමිකම් සහතිකයක් ප්‍රදානය කරනු ලබන්නේ උක්ත ඉඩමට අදාල සියලු කාරණා පිළිබඳව සිදු කරනු ලබන විමර්ශනයක් අවසානයේ දී ඉඩමේ නිරවුල් අයිතිය පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුවයි. පවතින ඔප්පුව අවලංගු කර ඒ වෙනුවට නිකුත් කරනු ලබන හිමිකම් සහතිකයේ සඳහන් ඉඩමේ හිමිකරු, ප්‍රමාණය, බැඳීම්, පරවශතා සහ හතර මායිම් පිළිබඳව රජය විසින් වග කියනු ලබන අතර පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක් තුළින් හිමිකම් සහතිකය හා ඊට අදාල හිමිකම් රෙජිස්ටරය මුද්‍රණය කරනු ලබන බැවින් වංචා හා දූෂණ සිදු කිරීමේ හැකියාව ද අවම මට්ටමක පවතී.

03. එමෙන්ම වසර 30 ක් හෝ ඊට වැඩි කාල සීමාවක් සඳහා අදාළ වන ඉඩමේ ලේඛන ගත (පත් ඉරු) ඉතිහාසය අධ්‍යයනය කිරීම තුළින් හිමිකම් සහතිකයක් නිකුත් කිරීමට කටයුතු කරන බැවින් ඉඩම ඇපයකට තබා බැංකු ණයක් ලබා ගැනීම වැනි කාර්යයක දී " හිමිකම් වාර්තාවක්" ලබා ගැනීමට අවශ්‍ය නොවේ.

04. හිමිකම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන යටතේ නිකුත් කරනු ලබන හිමිකම් සහතිකයේ ඉඩම පිළිබඳ තොරතුරු මෙන්ම ඉඩමේ පිහිටීම සහ හතර මායිම් දැක්වෙන දළ සැලැස්මක් ද අඩංගු වේ. එසේ වුවත් මෙම ලේඛනය ඉඩමේ හිමිකම පිළිබඳ තහවුරු කෙරෙන ලේඛනයක් පමණක් වන අතර ඉඩම ඇපයට තබා ණය මුදලක් ලබා ගැනීම වැනි කාර්යයක දී සංවර්ධන පිඹුරක් ලෙස භාවිතා කිරීමට එය යොදා ගත නොහැක.

05. එවැනි අවස්ථාවක දී ඉඩමට අදාළ කැඩැස්තර සිතියමෙහි සහතික පිටපතක් මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙතින් ලබාගෙන එහි සංවර්ධන ලක්ෂණ බලයලත් මිනින්දෝරුවරයෙකු මගින් ඇතුළත් කරවා ගැනීම තුළින් සංවර්ධන පිඹුරක් සකස් කරවා ගැනීමට හැකියාව පවතින අතර අදාළ සැලසුම් අනුමත කිරීමේ දී අනුමත සටහන් යෙදිය යුත්තේ මෙම පිඹුරෙහි පමණි.(හිමිකම් සහතිකය මතුපිට කිසිදු සටහනක් තැබිය නොහැකිය)

06. මේ පිළිබඳව ඔබගේ අවධානය යොමු කර බැංකු කටයුතු වල දී හිමිකම් සහතිකය සඳහා ප්‍රමුඛතාවක් දී කටයුතු කරන ලෙසත්, මේ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රාදේශීය කළමනාකරුවන් සහ නීති නිලධාරීන් දැනුවත් කිරීමට පියවර ගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පී.එම්.එච්. ප්‍රියදර්ශනී**
ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල්

**පිටපත**

සර්වේයර් ජනරාල් - කා.දැ.ස.


| | | | | | |
|---|---|---|---|---|---|
| හිමිකම්නිරවුල්කිරීමේකොමසාරිස්ජනරාල්<br>உரித்து நிர்ணய ஆணையாளர் நாயகம்<br>Commissioner of Land Title Settlement | 0112873862<br>0112797450 | කොමසාරිස්<br>ஆணையாளர்<br>Commissioner | 0112797451 | සහකාරකොමසාරිස්(පාලන)<br>உதவிஆணையாளர்(நிர்வாகம்)<br>Assistant Commissioner (Admin) | 0112797452 |
| සහකාරකොමසාරිස්(විමර්ශන)<br>உதவி ஆணையாளர் (விமர்சனம்)<br>Assistant Commissioner (Investigation) | 0112797464 | ගණකාධිකාරී<br>கணக்காளர்<br>Accountant | 0112797459<br>0112797460 | කාර්යාලය(පොදු)<br>காரியாலயம் (பொது)<br>Office (Gen.) | 0112797400 |
| ඊ-මේල්/ மின்னஞ்சல்/e-mail lsdcomm@sltnet.lk | | | | ෆැක්ස්/தொலைநகல்/Fax | 0112882913<br>0112865975 |